# හම්බන්තොට ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය

1 **මූල්‍ය ප්‍රකාශන**

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 168 (1) ප්‍රකාර එක් එක් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඊට පසු වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වසරේ හා ඉකුත් වසරේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ ගනුදෙනු හා කාර්ය සාධනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 11 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

## 1.2 ගනුදෙනු මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීති,රීති යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 571 (3) | රු. 250,818 ක් වු කල් පසු වු තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| **(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | |
| රීති 218 | සභාවට අයත් සියලුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් සමීක්ෂණය කළයුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |

(ඇ) චක්‍රලේඛ
----------

| | |
|---|---|
| 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 4.1 ඡේදය | සියළුම පළාත් පාලන ආයතන විසින් අනියම් හා තාවකාලික පදනමින් බඳවාගනු ලබන කාර්ය මණ්ඩලය වෙත රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පත්වීම් ප්‍රදානය කළයුතු බව දක්වා තිබුණද, සභාව විසින් ඊට පටහැනිව සේවකයන් නවදෙනෙකු සඳහා සේවක අර්ථසාධක අරමුදල් පත්වීම් ලබාදී තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------
2.1 ආදායම් පරිපාලනය
----------------------

2.1.1 බලපත්‍ර ගාස්තු
----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(2) වගන්තිය අනුව විවිධ වෘත්තීන් සම්බන්ධයෙන් බලපත්‍ර ගාස්තු පනවා අයකර ගැනීමට කටයුතු කළහැකි වුවත් නීතීඥ, වෛද්‍ය, නොතාරිස් හා රෙජිස්ට්‍රාර් වැනි වෘත්තීන් වලින් 2014 වර්ෂය තුල බලපත්‍ර ගාස්තු අයකිරීමට ක්‍රියාකර නොතිබුණි. හම්බන්තොට වරායෙන් ගොඩබාන වාහන ගාල් කිරීම පෞද්ගලික ආයතනයක් විසින් සිදු කරන අතර එම ස්ථානයෙන් බලපත්‍ර ගාස්තුවක් අයකළ හැකිව තිබුනද එසේ අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුනි.

2.1.2 පොදු වෙළඳපොල බදු දීම
---------------------------

නව මයුරපුර සතිපොළ 2014 වර්ෂය සඳහා රු. 25,200 ක මුදලකට ටෙන්ඩර්කර බදු දී තිබූ අතර නිසි පරිදි වාරික මුදල් අය නොවීම නිසා 2014 දෙසැම්බර් 31 දින වන විට රු.23,100 ක් වූ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.1.3 විනෝද බදු**

**-------------**

හම්බන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති වියළි කලාපීය උද්භිද උද්‍යානයෙන් හා කුරුළු උයනෙන් අලෙවි කරනු ලබන ප්‍රවේශපත් වලින් විනෝද බදු ලෙස ආදායමක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 වාහන පාලනය**

**------------------**

සභාවට අයත් අංක 252 – 6542 දරන කැබ්රථයට අදාලව 2014 වර්ෂයේ ධාවන සටහන් අනුව සභිකයින් විසින් ලිඛිතව වාහන වෙන්කරවා ගැනීමකින් තොරව කි.මී. 20,459 ක දුර ප්‍රමාණයක් ඉන්ධන ලීටර් 2607 ක් භාවිතා කර ගමන් කර තිබූ අතර සභිකයින්ගේ රාජකාරී කටයුතු සඳහා මාසික ඉන්ධන දීමනාවක් සහ යතුරු පැදියක් රජය විසින් ලබාදී තිබියදී මෙම කැබ්රථය භාවිතා කිරීමේ අවශ්‍යතාව කුමක්ද යන්න දක්වා නොතිබුණි. මීට අමතරව 2014 වර්ෂය තුළ සභාපතිවරයාගේ උපදෙස් මත රාජකාරී කටයුතු ලෙස දක්වමින් අවස්ථා 14 කදී කි.මී. 3280 ක් දුර ධාවනය කර තිබුනද වාහනය පාවිච්චි කළ අයගේ අත්සන් යොදා නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

**(අ) බහු කාර්ය ජංගම කුටි**

**-------------------------------**

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් 2013 අයවැය යෝජනා මගින් ක්‍රියාත්මක වූ පළාත්වල දිළිඳුකම අවම කිරීමේ සංවර්ධන වැඩසටහන යටතේ කැනපි ආවරණ කුටි 10 ක් සභාවට ලැබී තිබූ අතර 2015 ජනවාරි 20 දින භෞතික පරීක්ෂාවේදී එම කුටි 06 ක් ගබඩාවේ තිබූ අතර කුටි 02 ක් බාහිර පුද්ගලයෙකු විසින් කරන ලද ලිඛිත ඉල්ලීමක් මත මුදල් පදනමකින් තොරව ලබා දී ඇති බව ලේකම්වරයා ප්‍රකාශ කරන ලදී. ඉතිරි කුටි 02 ක සම්බන්ධව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය.

**(ආ) වීථි පහන් නඩත්තු වියදම්**

**----------------------------**

2014 වර්ෂයට සභාව මගින් වීථි පහන් නඩත්තු කිරීම වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු රු. 248,441 ක මුදල 2014 දෙසැම්බර් 31 වන විටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන**

**------------------------------------------------**

2014 වසරේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ අයවැය යෝජනා මඟින් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ සභාවට රු.12,000,000 ක් වෙන් කර තිබූ අතර ඉන් රු.4,000,000 ක් සභාවට ලැබී තිබුණි. මෙම මුදල් ලබා ගැනීම සඳහා සභාව විසින් යෝජිත ව්‍යාපෘතීන් වලට අදාල වාරික මුදල් ලබා ගැනීමේ ඉල්ලුම්පත්‍ර වල කර්මාන්ත 16 ක් සඳහා අවසාන ගෙවීම් කිරීමට ඉල්ලීම් කර තිබුණද ඉටු කර තිබුණේ එකතුව රු.1,000,000 ක් වූ කර්මාන්ත දෙකක් පමණි.

**(ආ) මානජ්ජාව දෙමටඅත්ත වැව පාර**

**-------------------------------------**

මානජ්ජාව දෙමටඅත්ත වැව පාරේ කරනේරිස් අප්පු මහතාගේ නිවස අසල පාර 1 හා 2 අදියරයන් 2014 ජුනි 30 හා 2014 අගෝස්තු 25 දින රු.500,000 බැගින් වූ රු. 1,000,000 ක ගිවිසුම් ගත මුදලකට අනුමත සමිතියක් වෙත පවරා ඉටුකරවා ගෙන තිබූ අතර 2015 ජනවාරි 21 දින මෙම කර්මාන්තය ස්ථානීය පරික්ෂාවේදී මාර්ගයේ බොහෝ ස්ථාන ගිලා බැස, පිපිරීම් සිදුව තිබූ බව නිරීක්ෂණය විය.

**(ඇ) තත්ත්ව පරීක්ෂණ ගාස්තු ගෙවීම**

**------------------------------------**

කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ක්‍රීට් කුට්ටි ගල් අතුරා ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන මාර්ග වල තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා වූ සත්‍ය වියදම නොසලකා වැඩනිම් වාර්තාවේ ඊට වැඩි වටිනාකමක් ඇතුළත් කිරීමෙන් 2014 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීමේදී රු.342,693 ක මුදලක් වැඩියෙන් ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය.

**4.** **පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ආදායම් පරිපාලනය